1st Place Winner
National Productivity
Award 2020

SLSI
SYSTEM ISO 9001 CERTIFIED

SLAB ACCREDITED
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/7/1/3 | ඔබේ අංකය<br>உமது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2026.05.06 |

**ප්‍රධාන ලේකම් (මුදල්) චක්‍රලේඛ - 01/2026**

දකුණු පළාත් සභාවේ සියලුම
ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා
ගණන්දීමේ නිලධාරීන් වෙත.

<u>බලශක්ති අර්බුදය තුළ රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම</u>

මැදපෙරදිග කලාපයේ පවතින යුධමය වාතාවරණය හේතුවෙන් ආර්ථිකයට සිදු වී ඇති බලපෑම් සමනය කරමින් අත්‍යාවශ්‍ය රාජ්‍ය සේවා පවත්වාගෙන යාම තහවුරු කිරීමට, පවතින රාජ්‍ය මූල්‍ය සීමාවන් සහ අනුමත රජයේ වියදම් සීමාවන් තුළ රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම අවශ්‍ය වී ඇති බව භාණ්ඩාගාර ලේකම් විසින් 2026.04.02 දිනැතිව නිකුත් කර ඇති අයවැය චක්‍රලේඛ 01/2026 මඟින් පෙන්වා දී ඇත. ඒ අනුව, එකී චක්‍රලේඛය පහත පරිදි අදාළ කර ගැනීමට දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවරු අනුමැතිය ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/SP/1/1/01 හා 2026.04.29 දිනැති ලිපිය මඟින් ලබා දී ඇත.

02. ඉන්ධන නිකුත් කිරීම සීමා කර තිබීම හා බදාදා දිනය රජයේ කාර්යාල නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සැලකිල්ලට ගනිමින්, අමාත්‍යවරුන්ට, නියෝජ්‍ය අමාත්‍යවරුන්ට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, රාජ්‍ය නිලධාරීන්ට සහ වෙනත් කාණ්ඩවලට හිමිගන්වා ඇති ඉන්ධන දීමනාව නැවත දැනුම් දෙනතුරු 2026.03.01 දින පැවති ඉන්ධන මිල පදනම් කරගනිමින් ලබා දීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇති බැවින් එම චක්‍රලේඛයේ සඳහන් පරිදි කටයුතු කළ යුතු ය.

03. එබැවින්, දකුණු පළාත් සභාවට අදාළ වන පරිදි 2019.05.28 දිනැතිව නිකුත් කර ඇති අංක 02-2019 (I) දරන ප්‍රධාන ලේකම් (මුදල්) චක්‍රලේඛය මඟින් හිමිගන්වා ඇති ඉන්ධන ප්‍රමාණ හා ඉන්ධන දීමනා සම්බන්ධයෙන් ඉහත 02 ඡේදය අනුව කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

**චන්දිම සී. මුහන්දිරම්ගේ**
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් -
1. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, දකුණු පළාත. - දැ.ගැ.ස.
2. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත. - දැ.ගැ.ස.
3. අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) - දැ.ගැ.ස.
4. අධ්‍යක්ෂ (අයවැය) - දැ.ගැ.ස.